

# ලෝක ආදිවාසීන්ගේ අනාගතය අවදානම්

කොළඹ විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
එච්.කේ.එන්. කරුණාරත්න

**ආදිවාසීන් ලෙස අර්ථ දක්වා ඇත්තේ රටක මුල් පදිංචිකරුවන් ය. හුදකලාව ජීවත්වීම ඔවුන්ගේ විශේෂ ලක්ෂණයකි. එහෙත් විද්‍යාව හා තාක්ෂණය අතින් මිනිසා ලබා ඇති දියුණුව හමුවේ වනාන්තරවාසී බොහෝ ආදිවාසීන්ගේ පැවැත්මට කණකොකා හඬන්නට පටන් ගෙන තිබේ. මේ නිසා ලෝක ආදිවාසීන් බොහෝ දෙනෙකුගේ අනාගතය අවිනිශ්චිත තත්ත්වයකට පත්ව ඇත. තමන්ට හිමි අනන්‍යතාවත්, තම වාසභූමියත්, තම සිරිත් විරිත් සමූහයක් ලෙස සාමාජියව ජීවත්වීමේ අයිතියත් ඔවුනට අහිමි වෙමින් පවතී.**

එය පසුගිය වසර සියය තුළ වඩාත් කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබේ. මෙම තත්ත්වයට පිළියම් ලෙස ආදිවාසීන්ගේ අයිතිවාසිකම් රැකදීමේ අරමුණින් 1994 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අගෝස්තු 09 වැනිදා "ලෝක ආදිවාසීන්ගේ දිනය" (WORLD INDEGENOUS PEOPLE'S DAY) ලෙස නම්කර ඇත.

ආදිවාසීන් ජීවත් වන රටවල් 70 ක් නිවර්තන කලාපයෙන් හඳුනාගෙන තිබේ. බ්‍රසීලයේ එවැනි ගෝත්‍රික කණ්ඩායම් 96 ක් ගැන තොරතුරු ඇමෙරිකා එක්සත් ජනපදයේ Surviral International කණ්ඩායමේ අධ්‍යක්ෂව සිටි කෙනත් අයි ටේලර් ලෝකයට හෙළි කර ඇත. ඔහුගේ අවධානයට ලක් වූ ප්‍රධාන ගෝත්‍ර තුනකි. කයාපෝ(Kayapo), ටර්කානෝ (Terkano), සහ යනෝමාමි (Yanomami) එම ගෝත්‍ර වේ. මෙම ගෝත්‍රිකයින් තම වාසභූමිය වශයෙන් තෝරා ගෙන ඇත්තේ බ්‍රසීලයේ වර්ෂා වනාන්තර ය. අප්‍රිකානු කොංගෝ වනාන්තරයේ ජීවත් වන පිග්මි(Pygmie) සහ බන්ටු (Bantu), තායිලන්තයේ ලූආ (Lua), සරවක්හි පෙනාන්(penan), ඕස්ට්‍රේලියාවේ ඇබොර්ජින්ස්(Aborigines) වැනි ආදිවාසී ගෝත්‍ර ගැනද ටේලර් මෙන්ම 'මිහිතලයේ මිතුරෝ' (Friends of the Earth) නැමති සංවිධානය විසින් ඉමහත් දත්ත ප්‍රමාණයක් ලේඛනගත කර තිබේ.

## ආදිවාසීන්ගේ විශේෂිතා :

(1) ස්වාභාවික වනාන්තරයට භෞතික වශයෙන් අනුවර්තනය වූ කොට්ඨාශයකි. ඒ නිසා ශරීර ව්‍යූහය මගින් උත්පාදනය කරන තාපය ඉතා අඩු ය. උත්පාදනය වන තාපය ක්‍රමානුකූල ලෙස පරිසරයට විසරණය වේ. එවිට අධි තාපයෙන් ඔවුහු ආරක්ෂා වෙති. දහඩිය පිට කිරීම අඩු නිසා ජලය අවශ්‍ය වන්නේ මඳ වශයෙනි. එමෙන්ම ප්‍රෝටීන ද අවශ්‍යවන්නේ සුළු වශයෙනි. එම සුළු ප්‍රෝටීන සංචිතය සති ගණනාවකට ප්‍රමාණවත් වේ. කිසිවිටෙක දරුණු රෝගවලින් පෙළෙන්නේ නැත. ඒ නිසා පිළිකා, අධික රුධිර පීඩනය සහ හෘදයාබාධ වාර්තා නොවේ. එහෙත් වෙනත් වයිරස රෝගවලට ඔවුහු ගොදුරු වන බව සඳහන් වේ.



(2) ඔවුන් තුළින් විද්‍යාමාන වන විශ්වාසයන් ගැන අඩුවෙන් තක්සේරු නොකළ යුතුවීම වැදගත්. වනාන්තරය ඔවුන් සලකන්නේ තම 'නිවස' ලෙසිනි. එයින් තම ජීවිකාවට අවශ්‍ය සියළු ද ලබා දෙයි. තමන්ගේ ආරක්ෂාව සලසා දෙන්නේ ද වනාන්තරය ම ය. බටහිර සංස්කෘතියෙන් ආභාෂය ලැබූ මිනිසුන්ට වනාන්තරය යන වචනය ඇසූ පමණින් බියකරු හා නොදන්නා ලෝකයක් මනසට ඇතුළු වේ. පිග්මි ගෝත්‍රිකයින් වනාන්තරයට ඉතාමත් හොඳින් ගෞරවය කරන බව පෙනේ. බත්වු ගෝත්‍රිකයින්ගේ විශ්වාසය වනාන්තරය තමන්ට අවශ්‍ය ලෙස හීලෑ කරගත හැකි බව ය.

(3) ඔවුන් තුළින් විද්‍යමාන වන තවත් විශේෂිතාවකි සහජීවන සම්බන්ධතාව (Symbiotic association) හේන් ගොවිතැන මීට හොඳ උදහරණයකි. වනාන්තරයෙන් තෝරා ගත් කොටසක ගස්වැල් කපා දමා ගිනි තබා සුළු පරිමාණයෙන් කෘෂිබෝග වගා කරනු ලැබේ. මෙලෙස සාරවත්භාවයෙන් දූප්පත් නිවර්තන පස් වලින් ඔවුහු ප්‍රයෝජන ලබති. වනාන්තරයෙන් තෝරාගත් කුඩා ප්‍රදේශයක් මෙලෙස කපා දැමූවද එය සුළු කාලයකින් නැවත පුනර්වර්ධනය සඳහා මුද හරින බැවින් පැළෑටි විවිධත්වයට මෙන්ම සත්ත්ව විවිධත්වයට හානියක් නොවූ බව ලෝක ප්‍රසිද්ධ පරිසර විද්‍යාඥ තෝමස් ඊ ලව්ජෝයි (1989) සඳහන් කර තිබේ. සහජීවන සම්බන්ධතාව නිසාම වනාන්තරයේ ඇති බහුල පාරිසරික සම්පත් සහ ඒවායේ

"පිට පළාත්වලින් අපේ වනාන්තරයට මිනිසුන් පැමිණෙනවා. ඔවුහු අපට අයිති ගස් කපනවා. කුරුල්ලන් මරනවා. කැලෑව ගිනි තියනවා. ඉන්පසු ගවයින් වනාන්තරයට ඇතුල් කරනවා. ඉතිරි වී ඇති පැළෑටි සියල්ලම ගවයින් කා දමනවා. මං හිතනවා ඒ මිනිස්සු වනාන්තරයට වෛර කරන බව. එහෙත් මම බෝග වගා කරනවා. වල් පැළ නෙලනවා. වනසතුන් බලාගන්නවා. වනාන්තරය බලා ගන්නවා. වනාන්තරය රැක ගන්නවා. එය අප සතු වාසභූමියයි."

විභව ප්‍රයෝජන ගැන ඔවුහු හොඳින් අධ්‍යයන කර ඇත්තාහ.

උතුරු තායිලන්තයේ ලුආ ගෝත්‍රිකයින් ආහාර බෝග 70 ක්, ඖෂධ පැළෑටි විශේෂ 21 ක්, සැරසිලිවලට ගන්නා පැළෑටි 20 ක් සහ ඩයිවර්ග නිපදවිය හැකි පැළෑටි වර්ද 07 ක් වගා කරනු ලැබේ. අග්නිදිග ආසියාතික ආදිවාසීන් මැලේරියාව, උදරයේ හට ගන්නා වන, උපදංශය(Syphillis)සහ වෙනත් ආබාධ (Other disorders) සඳහා පැළෑටි වර්ග 6,500 ක් උපයෝගී කරගෙන ඇත.(The Global 2000 Report)

## ආදිවාසීන්ගේ පරිහානියට බලපෑ හේතු


ඉහත විස්තර කළ ආදිවාසීන්ගේ විශේෂිතා සියල්ලම වාගේ පසුගිය අවුරුදු සියය පමණ කාලයේ සිට පරිහානියට පත්වෙමින් පවතී. ක්‍රි.ව. 1500 දී ඇමසන් වනාන්තරයේ ජීවත් වූ ඉන්දියානු ආදිවාසීන්ගේ ප්‍රමාණය දශ ලක්ෂ 5 ක් වූ අතර වර්තමානයේ දක්නට ලැබෙන්නේ 1,50,000 ක් පමණ සංඛ්‍යාවකි. බ්‍රසීලයේ යනෝමාමි ගෝත්‍රිකයින් සතුව පැවති මුල් වාසභූමිය ව. කි. මී. 95,000 වුවත් වර්තමානයේ ඇත්තේ ව.කි.මී. 24,000 පමණ භූමි ප්‍රමාණයකි. එම භූමි ප්‍රමාණය ද හුදෙකලා වූ දූපත් ලෙස කොටස් 19 කට බෙදී ගොස් තිබේ.

ටෙක්සාස්හි ඔස්ටින් නගරයේ මානව පරිසර විද්‍යාව පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජේම්ස් ඩී. නේෂන් විසින් වාර්තා කර ඇති ගිණිකොණදිග මෙක්සිකෝවේ මායා ගෝත්‍රයට අයත් ගොවියකු විසින් කළ ප්‍රකාශය ගැන අවධානය යොමු කළ විට ආදිවාසීන්ගේ පරිහානියේ තරම අවබෝධ කර ගත හැකි ය.

"පිට පළාත්වලින් අපේ වනාන්තරයට මිනිසුන් පැමිණෙනවා. ඔවුහු අපට අයිති ගස් කපනවා. කුරුල්ලන් මරනවා. කැලෑව ගිනි තියනවා. ඉන්පසු ගවයින් වනාන්තරයට ඇතුල් කරනවා.

ඉතිරි වී ඇති පැළෑටි සියල්ලම ගවයින් කා දමනවා. මං හිතනවා ඒ මිනිස්සු වනාන්තරයට වෛර කරන බව. එහෙත් මම බෝග වගා කරනවා. වල් පැළ නෙලනවා. වනසතුන් බලාගන්නවා. වනාන්තරය බලා ගන්නවා. වනාන්තරය රැක ගන්නවා. එය අප සතු වාසභූමියයි."

වර්තමානයේ මායා ජනගහනය ඉතා අඩු ය. තම වාසභූමිය වූ වනාන්තරය වටා ජීවත්වන්නේ නගර වලින් සංක්‍රමණය වූ ලක්ෂයක පමණ පිරිසකි.



අතිරික්ත ආහාර නිෂ්පාදනය සහ අධික ධන තෘෂ්ණාව නිසා එම සංක්‍රමණිකයින් වසරක් පාසා මායා ගෝත්‍රිකයින්ගේ වාසභූමිය ගොදුරු කර ගැනීමට දින ගනිමින් සිටිති.

පීටර් එච් රේවන්, ටෙරි එල් අර්වින්, ඩැනියෙල් එච් ජැන්සෙන් සහ කෙනත් අයි ටේලර් වැනි පරිසර විද්වතුන් ආදිවාසීන් ගැන කළ පර්යේෂණවලින් ආදිවාසීන්ගේ පරිහානියට බලපෑ අතිශය වැදගත් හේතු රැසක් පෙන්වා දී තිබේ. එම විද්වතුන් වැඩි වශයෙන් අධ්‍යනයට තෝරාගෙන ඇත්තේ බ්‍රසීලයේ ආදිවාසීන් ගැන ය. එයට ප්‍රධාන හේතුව 1960 ගණන්වල ආරම්භ වූ විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘතිවලින් ඇමසන් නිම්නය බහුජාතික සමාගම්වලට මෙන්ම බ්‍රසීලයේ ධනවතුන්ටත් විවෘත වූ නිසා ය. මෙම සිද්ධිය බ්‍රසීලයේ මෑත ඉතිහාසයේ සඳහන් වන්නේ 'ඇමසෝනියා මෙහෙයුම (Operation Amazonia) නමිනි. ඇමසෝනියා මෙහෙයුමට බ්‍රසීලයේ එවකට බලයේ සිටි හමුදා ආණ්ඩුව මුළුමනින්ම අනුමැතිය සහ අනුබලය ලබා දුනි. මෙහෙයුමේ සටන් පාඨය වූයේ "මිනිසුන් නැති ඉඩම්, ඉඩම් නැති මිනිසුන් සඳහා" යන්නයි. එයින් පෙන්නුම් කරන්නේ ආදිවාසීස්ගේ වාසභූමිය ඔවුන් වෙනුවෙන් නවදුරටත් වෙන් කර තබා ගැනීමේ අවශ්‍යතාව රජයට අවශ්‍ය නොවන බවකි. ක්‍රි. ව. 2050 වනවිට මුළුමනින්ම අවසන් කිරීමට සැලසුම් කර ඇති ජලවිදුලි බලාගාර සහ ජලාශ ගැන අවධානය යොමු කළ විට පෙනී යන්නේ ආදිවාසීන්ගේ වාසභූමිවලින් කොපමණ ප්‍රමාණයක් අනාගත පරම්පරාවට ඉතිරිවේද යන්නයි. ( 1 වන රූපය බලන්න)

ඇමසෝනියා මෙහෙයුමෙන් ප්‍රබල ලෙස පීඩා ලැබුවේ යනෝමාමි ගෝත්‍රිකයින් ය. යනෝමාමි ගෝත්‍රිකයින්ගේ පාරම්පරික ඉඩම් ධනවතුන්ගේ ග්‍රහණයට හසු වුණි. විරෝධය පළ කළ යනෝමාමි ගෝත්‍රික කණ්ඩායම් සමූලඝාතනය කරන ලදී. ස්ත්‍රීන් කෲර ලෙස දූෂණය කරන ලදී. සංවර්ධනය නාමයෙන් වනාන්තරය කපා දමුවද රත් ආකාර සොයාගත් නිසා සංවර්ධනය පසෙකට තල්ලු වී පොළව කැනීමට පළමු ස්ථානය දෙන ලදී. යනෝමාමි ගෝත්‍රිකයින් පදිංචිව සිටි රොයිමෝ වනාන්තරයේ කුඩා ගුවන් යානා ගොඩබැස්ස විය හැකි ගුවන් පථ සියයක් පමණ විවෘත කරන ලදී. ගුවන් යානා මගින් ආහාර, ඉන්ධන, කම්කරුවන් සහ යන්ත්‍රෝපකරණ වනාන්තරයට ගොඩබාන ලදී.

රත් ආකර වෙනුවෙන් වනාන්තර විනාශ වූ නිසා යනෝමාමි ගෝත්‍රිකයින් උග්‍ර ආහාර හිඟයකට මුහුණ දුණි. රත් ආකර කර්මාන්තයේ නියැළී සිටි කම්කරුවන් ගංගාවල මසුන් මැරීමත්, වනබිම්වල වඳුරන් සහ වල් ඌරන් අධික ලෙස දඩයම් කිරීමත් නිසා මෙම තත්ත්වය උද්‍ග වුණි. යන්ත්‍ර ක්‍රියාකාරීත්වය නිසා නිසල පරිසරය ඝෝෂාවෙන් පිරී ගියේ ය. කෙනත් අයි ටේලර් පෙන්වා දෙන අන්දමට ආහාර හිඟය නිසා යනෝමාමි ගෝත්‍රික ගැහැනුන් හිගමනටත්, පිරිමින් රත් ආකාරවල කම්කරුවන් වශයෙනුත් දඩමස් සපයන්නන් වශයෙනුත් ක්‍රියාකරනු ලැබීය.

ටින් කෑම වර්ග ඔවුනගේ දෛනික ආහාරවේලට එක් වුණි. මන්දපෝෂණය උග්‍ර තත්ත්වයට පත්වුණි. වේලාව දැනගැනීමේ අවශ්‍යතාවක් නොතිබුණත් අත්ඔරලෝසු පැළඳ සිටි යනෝමාමි පිරිමින් යනෝමාමි කණ්ඩායම්වල සාමාන්‍ය දර්ශනයක් බවට පත්ව තිබුණි.

රත්ගැරීම (Gold Panning) සඳහා අධික ලෙස රසදිය භාවිත කළ නිසා ගංගා ජලය දූෂණය වී තිබේ. එයින් දේශීය මත්ස්‍ය සම්පත මුළුමනින් ම අහිමි වී ගියේ ය.

සංක්‍රමණික පිරිස අධික වූ විට නොයෙකුත් රෝග ඉතා වේගයෙන් පැතිරයාම නිසා තත්ත්වය බරපතල වුණි. මැලේරියාව, සරම්ප, ක්ෂයරෝගය, නියුමෝනියාව, ඇස්දූවිල්ල සහ සමේ රෝග එයින් ප්‍රධාන වේ. 1987 දී ප්‍රථමවරට මැලේරියා රෝගය වාර්තා වූ අතර 1990 වනවිට යනෝමාමි ගහනයෙන් 90% ට එම රෝගය වැළඳී තිබුණි. එම රෝගයෙන් මිය ගිය සංඛ්‍යාව 12% සිට 68% දක්වා වර්ධනය වුණි.

**ලෝක පරිසරවේදීන්ගේ සහ බ්‍රසීලයේ පරිසර හිතකාමී ඇතැම් සංවිධානවලින් බ්‍රසීල් රජයට එල්ල වූ චෝදනා රාශියක් නිසා එවකට බ්‍රසීලයේ ජනාධිපතිව සිටි කොලෝර් පෙඩරල් පොලිසිය ලවා රන් ආකර වසා දැම්මටත්, ඉදිකර තිබූ කුඩා ගුවන් යානා තොටුපලවල් විනාශ කිරීමටත් පියවර ගන්නා ලදී. එහෙත් ආකර හිමි ධනවතුන්ගේ තර්ජන සහ බිහිසුණු ක්‍රියාවන් නිසා ජජනාධිපති කොලෝර් තමන් ප්‍රකාශයට පත් කළ නියෝගය තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීමෙන් අසරණ තත්ත්වයට පත් වුණි.**

බ්‍රසීලයේ රියෝද ජෙනිරෝ සහ සාම්පාවුලෝ නගරවලට පසුව වැඩිම එඩ්ස් රෝගීන් වාර්තා වූයේ යනෝමාමි ගෝත්‍රිකයන් ගෙනි.

ලෝක පරිසරවේදීන්ගේ සහ බ්‍රසීලයේ පරිසර හිතකාමී ඇතැම් සංවිධානවලින් බ්‍රසීල් රජයට එල්ල වූ චෝදනා රාශියක් නිසා එවකට බ්‍රසීලයේ ජනාධිපතිව සිටි කොලෝර් පෙඩරල් පොලිසිය ලවා රන් ආකර වසා දැම්මටත්, ඉදිකර තිබූ කුඩා ගුවන් යානා තොටුපලවල් විනාශ කිරීමටත් පියවර ගන්නා ලදී. එහෙත් ආකර හිමි ධනවතුන්ගේ තර්ජන සහ බිහිසුණු ක්‍රියාවන් නිසා ජජනාධිපති කොලෝර් තමන් ප්‍රකාශයට පත් කළ නියෝගය තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීමෙන් අසරණ තත්ත්වයට පත් වුණි. 1990 දී ජනාධිපති කොලෝර් යනෝමාමි ගෝත්‍රිකයින්ගේ වාසභූමිවල නතරවීමට ආකර හිමි ධනවතුන්ට අවසර ලබාදීම නිසා යනෝමාමින්ගේ මළගම වේගවත් කිරීමට ධනවතුන් පසුබට වූයේ නැත. 1991 දී ඉතිරි වී සිටි යනෝමාමි ගෝත්‍රිකයින් වෙනුවෙන් රක්ෂිතයක් ප්‍රකාශයට පත් කිරීමට තරම් බ්‍රසීල් රජය සානුකම්පිතවීම ගැන පරිසරවේදීහු සතුටු වෙති.

යනෝමාමි ගෝත්‍රිකයින් මුහුණ දුන්නාට වඩා ප්‍රබල ගැටළු රාශියකට මලයාසියාවේ සරවක්හි පෙනැන් ගෝත්‍රිකයින් මුහුණ දීමේ සිද්ධියක් ද ටෙරි එල් අර්වින් වාර්තා කර තිබේ. දැව වෙනුවෙන් විනාශ වන තම වාසභූමිය රැක ගැනීමට පෙනාන් ගෝත්‍රිකයින් කටුක අරගලයක(acrimonious struggle) යෙදී සිටියෝ ය. දැව වෙනුවෙන් වාර්ෂිකව ව.කි.මී. 2000 පමණ වනාන්තරයක් කපා දමන ලදී. පෙනැන් ගෝත්‍රිකයින්ගේ දඩයම, ඉටි සහ රෙසින් එකතු කිරීම, ඖෂධ පැළෑටි එකතු කිරීම, තාල වර්ගයේ ගස්වලින් බීජ තෙලා ගැනීම මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළුමනින්ම ඇණ හිටියේ ය. ගෝත්‍රිකයින් එක්රැස්වී වනයට පිවිසෙන මාර්ග සියල්ලම වසා දමන ලදී. එය 1987 අප්‍රේල් සිට ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ සාර්ථක ලෙස ක්‍රියාත්මක වුවත් 1987 ඔක්තෝබර් මාසයේදී මැලේසියානු පොලිසිය අනපේක්ෂිත ලෙස කඩාවැදී එම බාධක ඉවත් කර ගෝත්‍රිකයින් 48 දෙනෙක් සිරභාරයට ගන්නා ලදී. නව නීති පැනවීමට සිදු වුණි. දැව තෙලාගැනීමට හා දැව පරිවහනයට බාධාකරන ඕනෑම කෙනෙකුට වසර දෙකකට නොඅඩු සිර දඬුවමක් සහ සිංගප්පූරු ඩොලර් 6,000 දඩයක් නියම කරන ලදී. එහෙත් පෙනැන් ගෝත්‍රිකයින් නැවතත් තම කටුක අරගලය දියත් කිරීමට සමත් වූහ. නැවත පොලිසිය මැදිහත්වී 128 දෙනෙකු සිරභාරයට ගෙන දැව කැපීම දිවා-රාත්‍රී දෙකෙහිම නොකඩවා සිදු කිරීමට රජය අවසර ලබා දුණි. විදුලි ජනක යන්ත්‍ර උපයෝගීකරගෙන වනාන්තරය ආලෝකවත් කරමින් රාත්‍රිය පුරා දැව කපා ගැනීම ඉතිහාසයේ ප්‍රථමවරට වාර්තා වන්නේ මලයාසියාවෙනි.

ඉංග්‍රීසි ජාතිකයින් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ කාලයේදී ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටි මුල් පදිංචිකරුවන් හඳුන්වා දී ඇත්තේ "ඇබොරිජින්ස්" නමිනි. ඇබොරිජින්ස් යන වචනයේ තේරුම "ආදිවාසීන්"(Native people) යන්නයි. ඇබොරිජින්ස්වරු වසර 30,000 කට කලින් අග්නිදිග ආසියාවෙන් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ පිරිසක් ලෙස සැලැකේ. දඩයම ප්‍රධාන ජීවිකාව වන අතර පලතුරු ආහාරයට ගැනීමට වැඩි රුචිකත්වයක් පෙන්වයි. පරිසරය තුළ ඔවුනට හමු වූ වන සතුන් ඉතා අලංකාර ලෙස ගල්ගුහාවල සහ ගස්වල පොතුවල චිත්‍රයට නගා ඇත.

ඇබොරිජින්ස්වරුන් ගේ ගුහා චිත්‍ර දක්නට ලැබෙන ස්ථාන 2 වන රූපසටහනේ පෙන්වා ඇත. ඕස්ට්‍රේලියාවේ උතුරු කොටසේ පිහිටි කකාඩුවල (kakadu) ඇති ගුහා චිත්‍ර දක්නට ලැබෙන ස්ථාන 5000 පමණ ඇත. ගුහා චිත්‍රවලින් පොහොසත් ලෝකයේ දැනට සොයාගෙන ඇති එකම ස්ථානය කකාඩු ප්‍රදේශය ය. මෙහි ඇති සමහර චිත්‍ර වසර 25,000 කට වඩා පැරණි ය. සත්ත්ව පාලනය, නිෂ්පාදන කර්මාන්ත, ආකර කර්මාන්ත සහ නාගරිකරණය නිසා ඇබොරිජින්ස්වරුන්ගේ ගහනය 1950 වනවිට 30,000 දක්වා අඩු වුණි. ඇබොරිජින්ස් ගහනයෙන් 40% ජීවත් වන්නේ රට අභ්‍යන්තරයේ ඇති කාන්තාරවල ය. වර්තමාන ජනගහනය 2,20,000 පමණ වේ. ඉංග්‍රීසි ජාතිකයින් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ 18 වන සියවසේදී ඇබොරිජින්ස්වරුන්ගේ ගහනය 3,50,000 බව සඳහන් වේ.

ඕස්ට්‍රේලියානු ආණ්ඩුව ආදිවාසීන් රැක ගැනීමට උනන්දුවීම නිසා ඔවුන්ගේ ඇතැම් වාසභූමි ආරක්ෂා කිරීමේ නීතිමය පියවර ගෙන ඇත. උලුරු ජාතික වන උද්‍යානය පිහිටුවීම එහි වැදගත් ප්‍රතිඵලයකි. මධ්‍යම ඕස්ට්‍රේලියාවේ මෙම උද්‍යානය පිහිටා තිබේ. එහි වපසරිය ව.කි.මී. 1325 කි. ඇබොරිජින්ස්වරුන්ට අයත් ආගමික හා සංස්කෘතික උරුමයන් රාශියක් වන උද්‍යානය තුළ ආරක්ෂා වී පවතී. 1987 දී ලෝක උරුම ලැයිස්තුවට වන උද්‍යානය ඇතුළත් කරන ලදී. එම වන උද්‍යානයේ කළමනාකරණ කටයුතුවලදී ඇබොරිජින්ස්වරු වැඩි නියෝජනයක් පෙන්වීම කැපී පෙනෙන ලක්ෂණයකි. එහෙත් ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් නිසා දෝ බොහෝ ඇබොරිජින්ස්වරු නාගරික ප්‍රදේශවල රැකියාවලට වැඩි ප්‍රියතාවක් සහ නැඹුරුවක් පෙන්වන නිසා ඔවුන්ගේ ආදි සිරිත් විරිත් සහ කලාශිල්ප ඇතුළු පාරිසරික දැනුම ඕස්ට්‍රේලියාවේ දකුණු සහ නැගෙනහිර ප්‍රදේශවලින් අභාවයට යැමේ ප්‍රවනතාවක් දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ වන්නියලැත්තෝ ද ගැටළු රැසකට මුහුණදී ඇති බව මෑතකදී මෙරට පුවත්පත්වල පළවී තිබිණි. 2004 ජූලි මස 28 දින පරිසර සහ ස්වාභාවික සම්පත් ඇමති ඒ.එච්.එම්. පවුසි මහතා මුණගැසුණු ආදිවාසී වැදිනායක ඌරුවරිගේ වන්නියලැත්තෝ තම සහෝදර ආදිවාසීන්ට එරෙහිව ඇති නඩු 34 ගැන කරුණු සාකච්ඡා කර ඇත. වන්නියලැත්තෝ පවුසි මහතා මුණගැසීමට වඩාත් උනන්දු වූයේ තම වර්ගයේ හතර දෙනෙකු කැලෑවේදී වෙඩි වැදී මියයාම නිසා ය. ජනාධිපතිනිය විසින් ආදිවාසී වන්නියලැත්තන්ට, වනාන්තරයට පිවිසීමට අවසර ලබාදී ඇති අතර

හැඳුනුම්පත් ද නිකුත් කර තිබියදීත් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග වන්නියලැත්තන් ගැටීමේ හේතුකාරණා සොයා බැලිය යුතුව ඇත. එවකට වැදිනායකව සිටි තිසාහාමිගේ ඉල්ලීම පිට 1990 දී ජනාධිපති ආර්. ප්‍රේමදාස විසින් මාදුරු ඔය ජාතික වන උද්‍යානයට අයත් භූමියෙන් අක්කර 1500 ක් 'වැද්දා වන්නි ඇත්තෝ සංස්කෘතිය'. (VEDDA WANNIETTO CULTURE) වෙනුවෙන් වෙන් කර දෙන ලදී. එමෙන්ම වන සත්ව සහ උද්භිද ආරක්ෂක ආඥාපනතේ කොන්දේසි යටතේ එම භූමිය 'අභයභූමියක්' ලෙස ප්‍රකාශයට පත් කර ගැසට් නිවේදනයක් ද නිකුත් කළේය. මහවැලි යෝජනා ක්‍රමය නිසා ඉදි කළ උල්හිටිය, රත්කිඳ හා මාදුරු ඔය ජලාශ නිසා වැද්දා වන්නි ඇත්තන්ගේ දඩයම් බිම් විශාල ප්‍රමාණයක් ඔවුනට අහිමිවීම නිසා මෙම පියවර ගන්නා ලදී. මීට පෙර ගල්ඔය යෝජනා ක්‍රමය (1949-1952) නිසා බිහි වූ සේනානායක සමුද්‍රයට වැද්දා වන්නි ඇත්තන්ගේ දඩයම් බිම් සහ ගුහා රැසක් මුළුමනින්ම ජලයෙන් යට වූ බව වාර්තා වී තිබේ. වර්තමානයේ වන්නි ඇත්තන්ගේ ප්‍රජාව පවුල් 234 කින් සමන්විත වේ.

මෙලෙස නිවර්තන ප්‍රදේශයේ විසිර සිටින ආදි වාසීන් තමන්ගේ නිජබිම රැකගැනීමේ නොනවතින සටනක යෙදී සිටිති. 1989 දී ප්‍රථමවරට බ්‍රසීලයේ අල්ටමීරා නගරයට එක්රැස් වූ ඉන්දියන් ගෝත්‍ර 28 කට අයත් 3500 පිරිසක් තමන්ගේ දුක්ගැනවිල්ල ලෝකවාසීන්ට හඬ නගා කියා සිටියෝ ය. ගුවන් විදුලි, රූපවාහිනී සහ ප්‍රවෘත්ති පත්‍ර මගින් එම පණිවිඩය ලොව පුරා ව්‍යාප්ත වූ අතර එය අතිශය සාර්ථක පියවරක් ලෙස සැළැකේ. රටවල් 100 පමණ ජාත්‍යන්තර නිරීක්ෂකයින් ආදිවාසීන්ගේ දුක්ගැනවිල්ලේ සාධාරණත්වය ගැන බ්‍රසිල් රජයට ඒත්තු ගන්වන ලදී. ලෝක බැංකුව බ්‍රසීලයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබා දුන් ණය මුදල් තාවකාලිකව අත්හිටුවා සාර්ථක බලපෑමක් කිරීමට සමත් වුණි. බ්‍රසීලියානු රජය පාරිසරික වැඩසටහන් දියත් කරමින් ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් 300-400 ක මුදලක් වෙන් කිරීමට කඩිනම් පියවර ගන්නා ලදී.

අගෝස්තු 09 වැනි දිනට යෙදී ඇති ආදිවාසීන්ගේ දිනය ආදිවාසීන්ගේ ජයග්‍රහණයක් ලෙස සැළැකේ. ආදිවාසීන් වනචාරී ගෝත්‍රිකයින් ලෙස සලකමින් ඔවුනගේ වාසභූමිය කොල්ලකෑමට සංවර්ධනය නාමයෙන් ඉදිරිපත් වන බහුජාතික සමාගම්වලට තම අභිමතය පරිදි කටයුතු කිරීම දැන් තරමක් අපහසු වී තිබේ. ආදිවාසීන්ට හිමි අනන්‍යතාවයත්, ඔවුන්ගේ

අගෝස්තු 09 වැනි දිනට යෙදී ඇති ආදිවාසීන්ගේ දිනය ආදිවාසීන්ගේ ජයග්‍රහණයක් ලෙස සැළැකේ. ආදිවාසීන් වනචාරී ගෝත්‍රිකයින් ලෙස සලකමින් ඔවුනගේ වාසභූමිය කොල්ලකෑමට සංවර්ධනය නාමයෙන් ඉදිරිපත් වන බහුජාතික සමාගම්වලට තම අභිමතය පරිදි කටයුතු කිරීම දැන් තරමක් අපහසු වී තිබේ. ආදිවාසීන්ට හිමි අනන්‍යතාවයත්, ඔවුන්ගේ වාසභූමියත්, ඔවුන්ගේ සිරිත් විරිත්, කලාශිල්පත්, සමූහයක් ලෙස සමාජයීයව ජීවත්වීමේ ඔවුනට ඇති අයිතිය ගැනත් පරිසරවේදීන් ඉතා ගෞරවනීය ලෙස සිහිපත් කරමින් ආදිවාසීන්ගේ විනාශය අවම කිරීම සඳහා නොනවතින සටනකට ප්‍රවිෂ්ට වී සිටිත්.

වාසභූමියත්, ඔවුන්ගේ සිරිත් විරිත්, කලාශිල්පත්, සමූහයක් ලෙස සමාජයීයව ජීවත්වීමේ ඔවුනට ඇති අයිතිය ගැනත් පරිසරවේදීන් ඉතා ගෞරවනීය ලෙස සිහිපත් කරමින් ආදිවාසීන්ගේ විනාශය අවම කිරීම සඳහා නොනවතින සටනකට ප්‍රවිෂ්ට වී සිටිත්. 'මිහිතලයේ මිතුරෝ' සංවිධානය මෙහි නායකත්වය ගෙන සිටීම ආදිවාසීන්ගේ වාසනාවක් බව අදහස් කෙරේ. මේ අතර ශ්‍රී ලංකාවේ ආදිවාසී වන්නියලැත්තන් වෙනුවෙන් දඹානේදී 2004 අගෝස්තු මස 09 දින කෞතුකාගාරයක් සහ සංස්කෘතික මධ්‍යස්ථානයක් විවෘත කරන ලදී. ආදිවාසීන් පමණක්ම වෙනුවෙන් ලොව ඉදිකළ පළමු කෞතුකාගාරය සහ සංස්කෘතික මධ්‍යස්ථානය මෙයයි. ආදිවාසීන් ගැනත් ඔවුන්ගේ ඇදහිලි ක්‍රම, ගී, නැටුම්, සිරිත් විරිත්, පාරම්පරිකව භාවිත කළ උපකරණ පිළිබඳවත් ජනතාවට අවබෝධයක් ලබාදීම මෙම මධ්‍යස්ථානයේ මූලික පරමාර්ථය වේ. ❑

